චක්‍රලේඛ අංක: 10/2003

මගේ අංකය: - එම්/ පත්/11/15
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක. 280, කෙලින්
කොළඹ 14.
2003. 09 - 17

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
(අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්)/
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් (ප්‍රාදේශීය ලේකම්වරුන්) හා
ඉඩම් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## නව පත්වීම් ලද වි.උ.ම. රෙජිස්ට්‍රාර්වරුන් සේවයේ ස්ථිර කිරීම

විවාහ, උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන් පත්කරනුයේ මාස හයක ආධුනික කාල සීමාවකට යටත්ව ය. ආධුනික කාල සීමාව අවසන්වීමෙන් පසු අදාල පරීක්ෂණය නොපමාව පවත්වා ස්ථිර කිරීමේ නිර්දේශය මා වෙත එවීමට කටයුතු කරන්න.

02. ආධුනික පත්වීම ලබාදී, මාස 06 ක් ඉක්මවූ විට අදාල ස්ථිර කිරීමේ පරීක්ෂණය පවත්වන බවට රෙජිස්ට්‍රාර්වරයාට මාස 02 කට කලින් දැනුම්දීමක් කළයුතුය. මාස 01 කට කලින් ඒ සඳහා දින නියමකර පරීක්ෂණයට පැමිණෙන ලෙස රෙජිස්ට්‍රාර් වරයාට දැන්විය යුතුය. දිස්ත්‍රික් ලේකම් විසින් හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් හෝ විභාගය පැවැත්විය යුතු වේ. විභාගයෙන් සමත්වීම සඳහා 50% වැඩි ලකුණු ලබාගත යුතුවේ.

03. තවද පත්වීම ස්ථිර කිරීමට නිර්දේශ කිරීමට ප්‍රථම රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරන ලද විවාහ, උප්පැන්න සහ මරණ සටහන් නිවැරදිව පිරිසිදුව හා පැහැදිලිව ලියා ඇති බවට සෑහීමකට පත්විය යුතු අතර, මුල් සහ දෙවන පිටපත්, සති වාර්තා යනාදිය නියමිත දිනයන්හි දී භාරදෙන බවට සෑහීමකට පත්විය යුතුය. විභාග වල ප්‍රතිඵල අනුව තම රාජකාරි පිළිබඳව මනා අවබෝධයක් ආධුනිකයාට ඇති බවටත් ඔහු ස්ථිර කිරීමට වෙනත් බාධාවක් නොමැති බවටත් දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් සෑහීමකට පත්වුවහොත් විභාගය පවත්වා සතියක් තුළ ඒ බවට නිර්දේශයක් ලියාපදිංචි කිරීමේ ආ.77 ආකෘතියෙහි පිටපත් දෙකකින් ද පත්වීම් දී ඇති එක් එක් ආඥා පණත යටතේ අංක පනු එන බැවින් ලියාපදිංචි කිරීමේ ආ.80 ආකෘතියෙහිද රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත එවිය යුතුය. අවශ්‍ය පුහුණුව දී ඇති බවද එකී වාර්තාවේ සඳහන් විය යුතුය. යම් යම් හේතු නිසා ආධුනිකයා තනතුරේ ස්ථිර කිරීමට දිස්ත්‍රික් ලේකම්ට/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්ට නොහැකි වුවහොත් ඒ හේතු සඳහන් වාර්තාවක් ගතයුතු පියවර නිර්දේශ කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල් ට එවිය යුතුය.

04. ආධුනික කාලය ගතවීමෙන් පසු මෙතෙක් ස්ථිර පත්වීම් දී නැති රෙජිස්ට්‍රාර්වරුන් පිළිබඳව ඉහත සඳහන් පරිදි කටයුතු කර නොපමාව ඔබගේ නිර්දේශය එවීමට කටයුතු කරන්න.

05. මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි විධිවිධාන ලෙස ඔබගේ කාර්ය මණ්ඩලයට උපදෙස් දිය යුතු අතර, එසේ ලබා දුන් බව මා හට දැනුම් දිය යුතුය.

06. මෙම චක්‍රලේඛය ලද බව කරුණාවෙන් දන්වන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:- 1. ලේකම් - දැ.ගැ.පි.
ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය.

2. සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් - දැ.ගැ.පි. හා අ.ක.ස.

3. සියළුම පළාත් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වරුන් - දැ.ගැ.පි. හා අ.ක.ස.

4. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික්
රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.පි. හා අ.ක.ස.

5. ගරු ලේකම්
දිය ව්‍යාප්ත වි.උ.ම.සංගමය.

සභු.